[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය I | පැය - 03 යි. |
|---|---|---|---|

නම/පන්තිය/විභාග අංකය : ..........................................................................................................

සැලකිය යුතුයි :-
- ✷ සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ✷ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40)

● **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 04 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හාදාරා තිබූ සඳුන් ප්‍රධාන පාරට මුහුණලා තිබූ තමාට අයත් ඉඩමකින් භාගයක් විකුණා ලබාගත් මුදල් යොදවා **"සඳුන් මෝටර් ගරාජ්"** නමින් මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ආයතනයක් තමාට අයත් ඉතිරි ඉඩම් කොටසේ ඇරඹූ අතර, ඔහුගේ පියා සතුව තිබූ මෝටර් රථ අළුත් වැඩියා කිරීමේ උපකරණ ද ඔහුට ලබා දෙන ලදී. මෙම මෝටර් රථ ව්‍යාපාරය ඇරඹූ ස්ථානයේ ඇති ප්‍රධාන පාරේ දෛනිකව විශාල වාහන සංඛ්‍යාවක් ගමන් ගනී.

01. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වාභාවය අනුව **"සඳුන් මෝටර් ගරාජ්"** කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේද?
    1. කේවල ස්වාමි ව්‍යාපාර
    2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
    3. සේවා සැපයීමේ ව්‍යාපාර
    4. හවුල් ව්‍යාපාර

02. මෙම ව්‍යාපාරයට අවස්ථාවක් වන්නේ,
    1. සඳුන් මෝටර් රථ කාර්මික පාඨමාලාවක් හදාරා තිබීමයි.
    2. සඳුන්ට ඉඩමක් තිබීමයි.
    3. ව්‍යාපාරය ඇති ස්ථානය ඉදිරිපිට පාරේ දෛනිකව විශාල වාහන සංඛ්‍යාවක් ගමන් කිරීමයි.
    4. සඳුන්ගේ මූල්‍ය ශක්තිය සතුටුදායක වීමයි.

03. **"සඳුන් මෝටර් ගරාජ්"** ලියා පදිංචි කිරීම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම මඟින් ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් ඇති වේ.
    2. ව්‍යාපාරය ලියා පදිංචි කළ පසු ව්‍යාපාරයේ නිරතව බැංකු ණය ලබාගත හැක.
    3. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා සඳුන් යා යුත්තේ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලට යි.
    4. ලියාපදිංචි කළ පසු ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇති වේ.

04. සඳුන්ගේ ව්‍යාපාරයට ඇති ශක්තියක් වන්නේ,
    1. සඳුන් මෝටර් රථ කාර්මික පාඨමාලාවක් හදාරා තිබීමයි.
    2. සඳුන්ගේ ව්‍යාපාරය ඉදිරිපිටින් දෛනිකව විශාල වාහන ප්‍රමාණයක් ගමන් කිරීමයි.
    3. ව්‍යාපාරය පිහිටි ප්‍රදේශයේ වෙනත් මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාර පැවතීමයි.
    4. වර්තමානයේ දී රජය මෝටර් රථ ආනයනය තහනම් කිරීමයි.

● **ප්‍රශ්න අංක 5 සිට 8 දක්වා පිළිතුරු සැපයීමට පහත සිද්ධිය යොදා ගන්න.**

වර්තමානයේ ශ්‍රී ලංකාව වැටී ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඇති හොඳම මාර්ගයක් ලෙස සංචාරක කාර්මාන්තය යොදා ගත හැක. ශ්‍රී ලංකාව වටා ඇති මුහුදු වෙරළ මේ සඳහා යොදා ගත හැකි හොඳම සම්පතකි. මෙම කර්මාන්තයේ දියුණුව මඟින් රටට විදේශ විනිමය ගෙන ඒම, රැකියා අවස්ථා උත්පාදනය කිරීම, සංචාරක නිකේතන ඉදි වීම යනා දී ක්ෂේත්‍ර දියුණු කළ හැකි වනවා මෙන්ම අතුරුඵල ලෙස උද්ධමනය පහත යාම, ණය පොළී අනුපාත පහළ යාම වැනි දේ ද සිදු විය හැක.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

05. ඉහත සිද්ධියේ සඳහන් ආර්ථික පරිසර සාධක ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ,
 1. මුහුදු වෙරළ, විදේශ විනිමය අනුපාතය
 2. රැකියා නියුක්තිය, විදේශ විනිමය අනුපාතය
 3. ආර්ථික අර්බුදය, විදේශ විනිමය ඉපයීම
 4. සංචාරක නිකේතන, මුහුදු වෙරළ

06. ඉහත සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධකයක් වන භූමියට උදාහරණයක් වන්නේ,
 1. සංචාරක නිකේතන යි.
 2. මුහුදු වෙරළ යි.
 3. ස්වාභාවික පරිසයර යි.
 4. සංචාරක කර්මාන්තය යි.

07. උද්ධමනය, පොලී අනුපාතය යන සාධක ඇතුලත් ව්‍යාපාර පරිසර සාධකය වන්නේ,
 1. ගෝලීය පරිසරය යි.
 2. තාක්ෂණික පරිසරය යි.
 3. ආර්ථික පරිසරය යි.
 4. නෛතික පරිසරය යි.

08. සංචාරක කර්මාන්තය තුලින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය වන්නේ,
 1. ආරක්ෂාව  2. විනෝදය  3. සන්නිවේදනය  4. ප්‍රවාහනය

09. පහත වගුවේ X තිරුවේ ඇල්මැති පාර්ශ්වය ද Y තීරුවේ ඇල්මැති පාර්ශ්ව වෙතින් ව්‍යාපාර අපේක්ෂිත දායකත්වය ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. කළමනාකරුවෝ | A ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය |
| 2. සේවකයෝ | B ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම. |
| 3. අයිතිකරුවෝ | C ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීම. |
| 4. සැපයුම්කරුවෝ | D කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම. |

X තීරුවේ ඇල්මැති පාර්ශ්වය ද Y තීරුවේ ව්‍යාපාර අපේක්ෂිත දායකත්වය ද අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
 1. A C B D  2. C B A D  3. B C A D  4. B C D A

10. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර අධ්‍යනය තුලින් එම ව්‍යාපාරයට ඇති,
 1. අවස්ථා හා තර්ජන හඳුනාගත හැක.
 2. ශක්තීන් හා තර්ජන හඳුනාගත හැක.
 3. අවස්ථා හා දුර්වලතා හඳුනාගත හැක.
 4. ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක.

11. A රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා කැප වන අතර, B රැකියා සුරක්ෂිත බව පිළිබඳව උනන්දුවක් දක්වයි. ඉහත A සහ B ස්ථාන වලට අදාළ නිවැරදි යෙදවුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
 1. අයිතිකරුවෝ, රජය
 2. රජය, අයිතිකරුවෝ
 3. රජය, සේවකයෝ
 4. කළමනාකරුවෝ, සේවකයෝ

12. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදිව වර්ග කර ඇති පිළිතුර වන්නේ,
 1. සුළු පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
 2. රජයට අයත් ව්‍යාපාර, පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර
 3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
 4. කුඩා ව්‍යාපාර, විශාල ව්‍යාපාර

13. රාජ්‍ය සංස්ථා හඳුන්වනු ලබන වෙනත් නාමයන් ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ,
 1. රාජ්‍ය සමාගම, මණ්ඩලය, අධිකාරිය, කාර්යාංශය
 2. මණ්ඩලය, කොමිසම, අධිකාරිය, කාර්යාංශය
 3. දෙපාර්තමේන්තුව, රාජ්‍ය සමාගම, කොමිෂන් සභාව, සමායතනය
 4. සංස්ථාපිත සමාගම, මණ්ඩලය, අධිකාරිය, කොමිසම

14. නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධාන කාණ්ඩය ඇතුලත් නිවැරදි පිළිතුර නොවන්නේ,
 1. රාජ්‍ය සංස්ථා හා සංස්ථාපිත සමාගම්
 2. අධිකාරිය, රාජ්‍ය නීතිගත සංස්ථාව
 3. රාජ්‍ය සමාගම්, සමුපකාර සමිති
 4. හවුල් ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

15. ඒක පුද්ගල ව්‍යාපාර නාමයක් ලියා පදිංචි කිරීමේ බලධරයා වනුයේ,
   1. ප්‍රාදේශීය ලේකම්වරයා ය.
   2. ප්‍රාදේශීය සභා සභාපතිවරයා ය.
   3. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ය.
   4. අදාල පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ය.

16. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචිය සඳහා අප යා යුතු තැන සහ ඒක පුද්ගල ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා, ව්‍යාපාරය ආරම්භ කර අයදුම්පත ඉදිරිපත් කළ යුතු දින ගණන නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
   1. අදාල පළාත් සභාවට සහ දින 14 කට පෙරය.
   2. ප්‍රාදේශීය සභාවට සහ දින 14 කට පෙරය.
   3. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට සහ දින 14 කට පෙරය.
   4. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ දින 14 කට පෙරය.

17. ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වන්නේ,
   1. ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේ ද යන්න දැන ගැනීම.
   2. ව්‍යාපාරයේ මූල්‍ය තත්වය සතුටුදායක ද යන්න දැන ගැනීම.
   3. ව්‍යාපාර ඒකකය කෙරෙහි ඇල්මැති පාර්ශ්ව වලට තීරණ ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම.
   4. නීතිමය අවශ්‍යතාවයන් ඉටු කිරීම.

18. වියදම් පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
   1. ගැනුම්, කොමිස් ගෙවීම්, ඉදිරියට කළ ගෙවල් කුලී
   2. ගැනිලි, විදුලි වියදම්, දුරකථන වියදම්
   3. ආයෝජන, වරිපනම්, ගමන් වියදම්
   4. වරිපනම්, ගොඩනැගිලි අළුත්වැඩියා වියදම්, වැටුප් හා වේතන

19. ගැනිලි ගිණුම යනු,
   1. වත්කම් ගිණුමකි.    2. වියදම් ගිණුමකි.    3. ආදායම් ගිණුමකි.    4. හිමිකම් ගිණුමකි.

20. කිසියම් වත්කමක් හා වගකීමක් ගිණුම් වාර්තා වල පෙන්නුම් කිරීමට නම් වත්කමේ පිරිවැය හා වගකීමේ ගෙවිය යුතු අගය, පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය යුතුය.
   2. විශ්වාසදායී ලෙස මැනීමට හැකි විය යුතුය.
   3. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම සහ වර්තමාන බැදීමක් පැවතිය යුතුය.
   4. ජංගම සහ ජංගම නොවන ලෙස වෙන් කළ හැකි විය යුතුය.

21. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් | 50 000 | ගැනුම් | 25 000 |
| අමතර ප්‍රාග්ධනය | 20 000 | ගැනිලි | 5 000 |
| විදුලි වියදම් | 5 000 | ලද වට්ටම් | 2 000 |

   ඉහත තොරතුරු අනුව ව්‍යාපාරයේ ලාභය වන්නේ,
   1. රු. 37 000    2. රු. 22 000    3. රු. 35 000    4. රු. 47 000

22. 2023.10.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 170 000 | = | 120 000 | + | 50 000 |

   ව්‍යාපාරයේ අයිතිකරු සිය පෞද්ගලික මුදලින් වගකීම් තුල ඇතුලත් ණය හිමියන්ට රු. 20 000 ක් ගෙවූ පසු ගිණුම්කරණ සමීකරණය වන්නේ,
   1. 150 000 = 120 000 + 30 000    2. 170 000 = 140 000 + 30 000
   3. 150 000 = 100 000 + 50 000    4. 170 000 = 100 000 + 70 000

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

- **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 23 සිට ප්‍රශ්න අංක 24 දක්වා පිළිතුරු සපයන්න.**

A - ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා කාර්යාල උපකරණ මිලට ගැනීම.
B - අයිතිකරුගේ මුදල් ගැනිලි රු. 5 000
C - සේවක වැටුප් හා වේතන ගෙවීම රු. 20 000 යි.
D - රු. 50 000 ක බැංකු ණයක් ලබා ගනී.

23. ඉහත ගනුදෙනු වලට අනුව එක් වත්කමක් වැඩි වී තවත් වත්කමක් අඩු වන ගනුදෙනුව වන්නේ,
1. A  2. B  3. C  4. D

24. හිමිකම් වෙනස් වන ගනුදෙනු කාණ්ඩය වන්නේ,
1. A හා B  2. B හා C  3. C හා D  4. B හා D

25. ව්‍යාපාරයක අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10 000 කි. එය ගැලපීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. භාණ්ඩ ගිණුම හර (රු) 10 000
තොග ගිණුම බැර (රු) 10 000

2. ගැනිලි ගිණුම හර (රු) 10 000
ගැනුම් ගිණුම බැර (රු) 10 000

3. ගැනුම් ගිණුම හර (රු) 10 000
ගැනිලි ගිණුම බැර (රු) 10 000

4. තොග ගිණුම හර (රු) 10 000
ගැනිලි ගිණුම බැර (රු) 10 000

- **පහත තොරතුරු ඇසුරින් 26 සහ 27 සඳහා පිළිතුරු සපයන්න.**

අමල්ගේ ව්‍යාපාරයේ 2023.01.01 දිනට ආරම්භක වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | (රු.) | | (රු.) |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 50 000 | ණයහිමියෝ | 50 000 |
| මෝටර් රථ | 40 000 | බැංකු ණය | 200 000 |
| තොගය | 100 000 | | |
| ණයගැතියෝ | 50 000 | | |

ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය තුල පහත ගනුදෙනු සිදුවිය.
A - රු. 50 000 ක් වටිනා තොගයක් රු. 70 000 කට අත්පිට විකිණීම.
B - වැටුප් ගෙවීම රු. 25 000
C - අයිතිකරුගේ ගැනිලි රු. 10 000
D - රු. 2 000 ක පොලිය ද ඇතුලත්ව බැංකු ණය වාරිකය ගෙවීම රු. 20 000

26. ඉහත ගනුදෙනු අවසානයේ 2023.01.31 දිනට අමල්ගේ ව්‍යාපාරයේ හිමිකම වන්නේ,
1. රු. 37 000  2. රු. 783 000  3. රු. 837 000  4. රු. 80 000

27. ඉහත A, B, C හා D යන ගනුදෙනු තුලින් ව්‍යාපාරයේ වත්කම් වලට ඇති වන බලපෑම වනුයේ,
1. වත්කම් රු. 70 000 කින් වැඩි වීමයි.  2. වත්කම් රු. 105 000 කින් අඩු වීමයි.
3. වත්කම් රු. 35 000 කින් අඩු වීමයි.  4. වත්කම් රු. 175 000 කින් වැඩි වීමයි.

28. ව්‍යාපාරයක වත්කම් ගිණුම් වල පමණක් සටහන් කරන ගනුදෙනුව තෝරන්න.
1. බැංකු ණය රු. 20 000 ක් ගෙවීම.
2. සුළු මුදල් භාරකරුට රු. 10 000 ක් අග්‍රිමය ලෙස ලබා දීම.
3. රු. 100 000 ක පරිගණකයක් Abans (අබාන්ස්) සමාගමින් ගැනීම.
4. රු. 50 000 වටිනා භාණ්ඩ තොගයක් ණයට ගැනීම.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

29. වැඩිවීම හර අඩු වීම බැර යන ද්විත්ව සටහන් රීතිය අදාල වන්නේ,
1. වත්කම් හා ආදායම් වලට ය.
2. වත්කම් හා හිමිකම් වලට ය.
3. වත්කම් හා වියදම් වලට ය.
4. වත්කම් හා වගකීම් වලට ය.

30. නන්දනගේ ව්‍යාපාරය, රු. 50 000 ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම සම්බන්ධව ගිණුම් වල සටහන් කළ යුතු නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. භාණ්ඩ තොග ගිණුම හර (රු) 50 000
මුදල් ගිණුම බැර (රු) 50 000

2. භාණ්ඩ ගිණුම හර (රු) 50 000
ණයහිමි ගිණුම බැර (රු) 50 000

3. ගැනුම් ගිණුම හර (රු) 50 000
මුදල් ගිණුම බැර (රු) 50 000

4. ගැණුම් ගිණුම හර (රු) 50 000
ණයහිමි ගිණුම බැර (රු) 50 000

31. ව්‍යාපාරයක මූලික සටහන පොත් වල සටහන් කර තිබූ ගනුදෙනු දෙකක් පහත දැක්වේ.
- සුළු මුදල් භාරකරුට ගෙවීම් (අග්‍රිමය ප්‍රතිපූර්ණ කිරීම්) රු. 10 000
- ණයගැතියෙකුගෙන් ලැබීම් රු. 20 000

ඉහත ගනුදෙනු මූලික සටහන් පොත් වල සටහන් කිරීමේ දී භාවිතා කළ යුතු මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්,
1. සුළු මුදල් ගෙවීම් වවුචරය, ලදු පත
2. ගෙවීම් වවුචරය, ලදු පත
3. ගෙවීම් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය
4. සුළු මුදල් ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය

32. ගැනුම් ජනලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
1. ජංගම නොවන වත්කම් ණයට ගැනීම
2. අත්පිට ගැනුම්
3. වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම.
4. ලී බඩු අත්පිට මුදලට ගැනීම.

33. ජ'නල් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස යොදා ගන්නා මූලික සටහන් පොත වනුයේ,
1. බැංකු ගිණුමයි.
2. විකුණුම් ජනලය යි.
3. පොදු ජනලය යි.
4. මුදල් පොතයි.

34. මුදල් පොතකින් සිදු වන කාර්‍යයන් දෙක (ද්විත්ව කාර්‍යය) වනුයේ,
1. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සටහන් කිරීම යි.
2. ලෙජර ගිණුමක කාර්ය හා වත්කම් ගිණුමක කාර්යය යි.
3. මූලික සටහන් පොතක කාර්යය හා ලෙජර ගිණුමක කාර්යය යි.
4. වත්කම් ගිණුමක් ලෙස යොදා ගැනීම සහ මූලාශ්‍ර ලේඛන භාවිතා කිරීම යි.

35. වෙළෙඳ වට්ටම් සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,
1. වෙළෙඳ වට්ටම් ගිණුම්ගත වේ.
2. වෙළෙඳ වට්ටම් ගිණුමගත නොවේ.
3. ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේ දී ලබා දෙයි.
4. ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී ලැබේ.

36. වට්ටම් ගිණුම් අයත් වන්නේ,
1. වත්කම් හා වගකීම් ගිණුම් වලට ය.
2. වත්කම් හා හිමිකම් ගිණුම් වලට ය.
3. හිමිකම් හා වගකීම් ගිණුම් වලට ය.
4. ආදායම් හා වියදම් ගිණුම් වලට ය.

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

37. නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

1. මුදල් ගිණුම (හර) 8 100
   දුන් වට්ටම් ගිණුම (හර) 900
   ණයගැති ගිණුම (බැර) 9 000

2. ණයගැති ගිණුම (හර) 9 000
   මුදල් ගිණුම (බැර) 8 100
   දුන් වට්ටම් ගිණුම (බැර) 900

3. මුදල් ගිණුම (හර) 8 100
   ලද වට්ටම් ගිණුම (හර) 900
   ණයහිමි ගිණුම (බැර) 9 000

4. ණයහිමි ගිණුම (හර) 9 000
   දුන් වට්ටම් ගිණුම (බැර) 900
   මුදල් ගිණුම (බැර) 8 100

38. ව්‍යාපාරයක 2023.10.01 දිනට පැවති මුදල් ශේෂය රු. 125 000 ක් විය. ඔක්තෝම්බර් මස පළමු සතිය තුල පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

- රු. 20 000 ක වැටුප් ගෙව්වා
- භාණ්ඩ ගැනිලි රු. 5000
- මොහොමඩ්ගෙන් භාණ්ඩ මිලදී ගත්තා රු. 40 000
- පොලී ආදායම් ලැබුණා රු. 10 000

මෙම ගනුදෙනු සිදු වීමෙන් පසු මුදල් ශේෂය වන්නේ,

1. රු. 70 000   2. රු. 110 000   3. රු. 115 000   4. රු. 55 000

39. ව්‍යාපාරයක සුළු මුදල් පොතේ වෙනත් ලෙජර ගිණුම් (ලෙජර ගිණුම) තීරුවේ ඇතුලත් කරනු ලබන ගෙවීම් නිවැරදි ව දක්වා ඇත්තේ,

1. ගමන් වියදම්, ණයහිමියන්ට ගෙවීම්, සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම.
2. සේවක වැටුප් අත්තිකාරම් ගෙවීම්, ණයහිමියන්ට ගෙවීම්, ගමන් වියදම්
3. ණයහිමියන්ට ගෙවීම්, ගෙන ඒමේ කුලී, සුළු වටිනාකම් සහිත වත්කම් මිලට ගැනීම්
4. විවිධ වියදම්, ණයහිමියන්ට ගෙවීම්, ගෙන ඒමේ කුලී

40. ව්‍යාපාරයක 2023.09.01 දිනට සුළු මුදල් ශේෂය රු. 400 ක් විය. සැප්තැම්බර් (09) මාසයේ සුළු මුදල් ගෙවීම් වල එකතුව රු. 9 200 කි. 2023.09.30 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 800 කි. 2023 අගෝස්තු මාසයේ සුළු මුදල් ගෙවීම් වල එකතුව කොපමණ ද?

1. රු. 8 800   2. රු. 9 200   3. රු. 9 600   4. රු. 10 000

මතුගම අධ්‍යාපන කලාපය

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]



# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය II |
|---|---|---|

සැලකිය යුතුයි :-
- ✷ පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ✷ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථා වලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**01.** පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක (i) සිට (x) තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

තල් සංවර්ධන මණ්ඩලයේ සේවය කොට විශ්‍රාම ගිය ව්‍යවසායකත්ව ඩිප්ලෝමාධාරී, යාපනයේ පදිංචි **ඥානම් සිවාජිලිංගම්** මහතා තල් හකුරු සහ තල් පැණි මිලට ගෙන නැවත විකිණීමේ ව්‍යාපාරයක් කුලියට ගත් ගොඩනැගිල්ලක **"සිවා තල් නිෂ්පාදන"** නමින් 2023 ජනවාරි මස 01 වන දින ආරම්භ කරන ලදී. ඔහු යාපනය ප්‍රදේශයේ තල් හකුරු හා තල් පැණි නිෂ්පාදකයන්ගෙන්, ඔවුන්ගේ නිෂ්පාදිත මිලට ගෙන ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ බස්නාහිර, දකුණ, මධ්‍යම හා උතුරු මැද පළාත වැනි පළාත් වලට බෙදා හරිනු ලබයි. මෙම පළාත් වල මේ සඳහා විශාල ඉල්ලුමක් පවතී. මෙම කාර්යයන් කිරීම සඳහා 2023 ජනවාරි 01 වන දින රු. 50,000 ක මාසික වැටුපකට සේවකයෙකු බඳවා ගන්නා ලදී. 2023 ජනවාරි මස සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| ජනː 01 | රු. 500,000 ක් මුදලින් රු. 1,500,000 ක් වටිනා ඔහුගේ කුඩා ලොරි රථය ද ව්‍යාපාරයට යෙදවීය. එදිනම මූල්‍ය අවශ්‍යතා සඳහා **හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.** යෙන් රු. 250,000 බැංකු ණයක් 12% ක වාර්ෂික පොලියට ලබා ගන්නා ලදී. |
| ජනː 02 | ඇසුරුම් ද්‍රව්‍ය මිලට ගත්තා රු. 15,000 යි. |
| ජනː 03 | භාණ්ඩ අත්පිට මුදලට ගැනීම රු. 300,000 යි. |
| ජනː 04 | ඉන්ධන සඳහා වියදම රු. 12,000 යි. |
| ජනː 05 | භාණ්ඩ අත්පිට විකුණුම් රු. 200,000 ක් සහ ණයට විකුණුම් රු. 60,000 කි. |
| ජනː 10 | ණයට භාණ්ඩ ගැනුම් රු. 200,000 යි. |
| ජනː 12 | ණයට භාණ්ඩ විකුණුම් රු. 300,000 යි. |
| ජනː 15 | මාසික ගොඩනැගිලි කුලී ගෙව්වා රු. 30,000 යි. |
| ජනː 18 | අයිතිකරුගේ මුදල් ගැනිලි රු. 10,000 යි. |
| ජනː 20 | භාණ්ඩ අත්පිට විකුණුම් රු. 350,000 යි. |
| ජනː 20 | ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 250,000 යි. |
| ජනː 25 | ණයහිමියන්ට මුදල් ගෙව්වා රු. 150,000 යි. |
| ජනː 30 | සේවක වැටුප් ගෙව්වා රු. 50,000 යි. |
| ජනː 31 | මාසික බැංකු ණය වාරිකය ගෙව්වා රු. 12,500 එහි අඩංගු ණය පොලිය රු. 2 500 කි. |

ශ්‍රී ලංකාවේ ඉහත සඳහන් පළාත් තුළ තල් හකුරු සහ තල් පැණි වලට මෙන්ම කිතුල් හකුරු හා කිතුල් පැණි සඳහා ද විශාල ඉල්ලුමක් පවතී. එම ආදේශන නිෂ්පාදිත සමග ඇති තරගයට ද ඥානම් මහතාට මුහුණ දීමට සිදු වී ඇත. **තල් සංවර්ධන මණ්ඩලයෙන්** ලැබුණු පුහුණුව සහ උපකාර ඥානම් මහතාට ඉමහත් පිටුවහලක් වී ඇත. රටේ පවතින ආර්ථික අර්බුදය සිවාජිලිංගම් මහතාගේ ව්‍යාපාරයට බොහෝ සෙයින් බලපා ඇත.

♦ මෙම ව්‍යාපාරයේ 2023 ජනවාරි 31 දිනට තොග කිසිවක් ඉතිරි වී නැත. (මිලදී ගත් භාණ්ඩ සියල්ල විකුණා ඇත.)

(i) (අ) මෙම ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(ආ) එම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා යොදා ගන්නා නිෂ්පාදිත මොනවා ද?

(ii) (අ) සිවාජිලිංගම් මහතාගේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුද? හේතුව දක්වන්න.
(ආ) ලියාපදිංචි කළ යුතු නම් ඔහු යා යුත්තේ කුමන ස්ථානයකට ද?

(iii) (අ) සිවාජිලිංගම් මහතාගේ ව්‍යාපාරයට ඇති තර්ජනයක් ලියා දක්වන්න.
(ආ) මෙම සිද්ධියේ සඳහන් නෛතික පුද්ගලභාවය සහිත රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන එක (01) බැගින් ලියා දක්වන්න.

(iv) ඥානම් සිවාජිලිංගම් මහතාට ඇති ශක්තියක්, අවස්ථාවක් හා තර්ජනයක් ලියා දක්වන්න.

(v) 2023 ජනවාරි 1 දිනට සිවාජිලිංගම් මහතාගේ ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

(vi) බැංකු ණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(vii) ''සිවා තල් නිෂ්පාදන'' ව්‍යාපාරයේ 2023 ජනවාරි මස 31 දිනට ණයගැති ශේෂය සහ ණයහිමි ශේෂයන් වෙන වෙනම ගණනය කර පෙන්වන්න.

(viii) ''සිවා තල් නිෂ්පාදන'' ව්‍යාපාරයේ 2023 ජනවාරි 31 දිනට මුදල් ශේෂය ගණනය කර පෙන්වන්න.

(ix) ''සිවා තල් නිෂ්පාදන'' ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය සඳහා ලාභය ගණනය කරන්න.

(x) 2023 ජනවාරි මස 31 දිනට ඥානම් සිවාජිලිංගම් මහතාගේ හිමිකම ගණනය කරන්න.

**(එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
### (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) (අ) ව්‍යාපාරයක පොදුවේ (ප්‍රධාන වශයෙන්) දැකිය හැකි ව්‍යාපාර අරමුණු දෙක ලියා දක්වන්න.
(ආ) මූලික මිනිස් අවශ්‍යතා තුනක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න ලියා දක්වන්න.
(අ) ජීවත් වීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීම අත්‍යාවශය අතර වුවමනා සපුරා ගැනීම අත්‍යාවශ්‍ය නොවේ.
(ආ) ගොඩනැගිලි අයත් වන්නේ භූමිය නම් නිෂ්පාදන සාධකයට යි.
(ඉ) අවධානම් දැරීම ශ්‍රමය නැමැති නිෂ්පාදන සාධකයේ ප්‍රධාන කාර්යයකි.
(ඊ) ඇල්මැති පාර්ශවයක් ලෙස අයිතිකරුවන්ගේ ප්‍රධානතම අරමුණක් වන්නේ රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය ඇති කිරීමයි. (ලකුණු 02)

(iii) නොරොච්චෝල තාප විදුලි බලාගාරයේ (ලක් විජය විදුලි බලාගාරයේ) විදුලිය නිපදවීම සඳහා භාවිතා කරන ගල් අඟුරු දහනයෙන් පසු ඉවත් කරන **අළු** මිලට ගෙන ඒවා භාවිතා කර බ්ලොක් ගල් (සිමෙන්ති ගල් ආකාරයේ ගල්) නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සීමා සහිත AAC සමාගමේ ගැනුම්කරුවන් වන්නේ ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීමේ නිරත ප්‍රධාන පෙළේ ඉදිකිරීමේ සමාගම් ය. මෙම නිෂ්පාදිත වල බර අඩු කම සහ පිරිවැය අඩුවීම නිසා ඒවාට විශාල ඉල්ලීමක් දේශීයව සහ විදේශීයව ඇති වී තිබේ. විදේශීය ගැනුම්කරුවන් ලෙස මාලදිවයිනේ බොහෝ ගැනුම් කරුවන්ගෙන් ඇණවුම් ලැබී ඇත. මේ සඳහා ශ්‍රී ලංකා රජය විසින් විශේෂ දිරිගැන්වීමේ ක්‍රියාමාර්ග ලෙස බදු සහන යනාදිය සමාගමට ලබා දී ඇත. ඒ තුලින් සමාගම කම්කරුවාගේ සිට කළමනාකරණ වෘත්තිය දක්වා රැකියා අවස්ථා බොහොමයක් ලබා දී ඇත.

(අ) ඉහත සිද්ධියේ සඳහන් සී/ස AAC සමාගමේ ඇල්මැති පාර්ශව දෙකක් ලියා දක්වන්න.
(ආ) ඔබ ඉහත (අ) හි සඳහන් කළ ඇල්මැති පාර්ශ්වයන් ගෙන් ව්‍යාපාරය අපේක්ෂා කරන දායකත්වය බැගින් සඳහන් කරන්න.

(ලකුණු 02)

(iv) (අ) ව්‍යාපාර පරිසරය යන්න හඳුන්වන්න.
(ආ) ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතාවයන් පැන නගින්නේ කුමන ව්‍යාපාර පරිසරයෙන් ද යන්න සඳහන් කර එම ව්‍යාපාර පරිසරයට අයත් පාර්ශ්වයන් නම් කරන්න. (ලකුණු 02)

**(මුළු ලකුණු 08)**

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

03. (i) (අ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?
(ආ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වාභාවය අනුව ව්‍යාපාර වර්ග කරනු ලබන ආකාරයන් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය** නම් "✓" ලකුණ ද **අසත්‍ය** නම් "x" ලකුණ ද යොදන්න.
(අ) රාජ්‍ය අංශයේ ඇති ව්‍යාපාර වලින් ලාභ අරමුණු කරගත් ව්‍යාපාර වර්ගයක් වන්නේ රාජ්‍ය සමාගම් ය.
(ආ) ආයතනයක අභ්‍යන්තර පරිසර අධ්‍යයනය තුළින් ශක්තීන් හා අවස්ථාවන් හඳුනාගත හැකි අතර බාහිර පරිසර අධ්‍යයනය තුළින් දුර්වලතාවයන් හා තර්ජනයන් හඳුනාගත හැකිය.
(ඉ) නෛතික පුද්ගලභාවය යනු යම් ආයතනයක් නීතිය ඉදිරියේ දී නීතිමය පුද්ගලයෙකු ලෙස පිළිගැනීමයි.
(ඊ) සමුපකාර සමිතියක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් සාමාජිකයන් හත්දෙනෙකුවත් සිටිය යුතුය. (ලකුණු 02)

(iii) (අ) කොටස් නිකුත් කරමින් ප්‍රාග්ධනය සපයාගත හැකි ශ්‍රී ලංකාවේ විශාලතම ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(ආ) ඒක පුද්ගල ව්‍යාපාර නාමයක් ලිපාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය ලබා ගැනීමේ දී ලබාගත යුතු ඉල්ලුම් පත්‍ර දෙක ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) (අ) නීතිමය කටයුතු වලදී ආයතන ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටි යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(ආ) ලාභය අරමුණු කර නොගත් පොදු අංශයේ ව්‍යාපාර සංවිධානයක් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියා දක්වන්න.

(ලකුණු 02)
**(මුළු ලකුණු 08)**

04. (i) ව්‍යාපාරයකට ඇති ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් සහ තර්ජනයක් බැගින් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පසුගිය වර්ෂය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල වශයෙන් බලපෑම් එල්ල වූ ආර්ථික පරිසර සාධක හතරක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය** ද, **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) හවුල් ව්‍යාපාර සඳහා බලපාන පනතක් වන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනතයි.
(ආ) හවුල් ඔප්පුවක් ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් ඇති විය හැක.
(ඉ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව 20 දෙනෙකි.
(ඊ) ඒක පුද්ගල ව්‍යාපාර නාමයක් ලියා පදිංචිය තුළින් එම ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නොලැබේ. (ලකුණු 02)

(iv) තනිපුද්ගල ව්‍යාපාරයක් හා සැසඳීමේ දී හවුල් ව්‍යාපාරයක ඇති වාසි දෙකක් සහ අවාසි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)
**(මුළු ලකුණු 08)**

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

## II කොටස - ගිණුම්කරණය
**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

05. (i) (අ) ආදායම් යන්න හඳුන්වන්න. (ලකුණු 01)

(ආ) පහත අයිතම **වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම්** යටතේ වර්ග කොට දක්වන්න.

ගැනුම්, ගෙවූ විකුණුම් කොමිස්, ගෙන ඒමේ කුලී, ගෙන යාමේ කුලී, විකුණුම් පිරිවැය, සුළු මුදල් ශේෂය, ගැනිලි, ලද වට්ටම්, ගෙවල් කුලී, බැංකු අයිරාව, උපචිත විදුලි වියදම්, ණයගැතියෝ, බැංකු ණය, ප්‍රාග්ධනය, විකුණුම්, ලැබිය යුතු ණය (ලකුණු 04)

(ii) 2022 දෙසැම්බර් මාසයේ කුමාරගේ ව්‍යාපාරයේ තොරතුරු ඔබට ලබා දී ඇත. එම තොරතුරු භාවිතා කර 2022.12.31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න.

| | රු. |
|---|---|
| 2022.12.01 දිනට ප්‍රාග්ධනය | 450 000 |
| දෙසැම්බර් මාසයේ ව්‍යාපාරයේ අලාභය | 45 000 |
| දෙසැම්බර් මාසය තුල අයිතිකරු යෙදූ මුදල් | 75 000 |
| මෙම මස අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි | 6 000 |
| මුදල් ගැනිලි | 5 000 |

දෙසැම්බර් 15 අයිතිකරු රු. 300 000 ක් වටිනා සිය පෞද්ගලික යතුරු පැදිය ව්‍යාපාරයට යෙදවීම (ලකුණු 02)

(iii) පහත ගනුදෙනු වල බලපෑම ගිණුම්කරණ සමීකරණය තුල පෙන්වන්න.

| | |
|---|---|
| 2022.12.01 | අයිතිකරු මුදලින් රු. 250,000 ක් සහ රු. 400,000 ක් වටිනා සිය පෞද්ගලික ගොඩනැගිල්ල ව්‍යාපාරයට යෙදවීම. |
| 2022.12.01 | **වර්ෂයකින් ගෙවා දැමීමේ එකඟතාවය මත** රු. 120,000 ක බැංකු ණයක් ලබා ගත්තා. වාර්ෂික පොලිය 10% කි. (පොලිය ද සමඟ එක් වාරිකයක් රු. 11,000 කි.) |
| 2022.12.05 | විකිණීම සඳහා රු. 75,000 ක් වටිනා භාණ්ඩ තොගයක් මුදලින් රු. 50,000 ක් ගෙවා ඉතිරි ණය පදනම මත ලබා ගැනීම. |
| 2022.12.10 | අත්පිට විකුණුම් රු. 75,000 යි. එම භාණ්ඩ වල පිරිවැය රු. 40,000 කි. |
| 2022.12.15 | ව්‍යාපාරයේ විදුලි බිල් ගෙවීම රු. 5,000 යි. |
| 2022.12.25 | අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණය හිමියන්ට මුදල ගෙව්වා. රු.20,000 යි. |
| 2022.12.30 | අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 5,000 යි. මුදල් ගැනිලි රු. 3,000 යි. |
| 2022.12.31 | මාසික පොලිය ද ඇතුලත්ව බැංකු ණය වාරිකය ගෙවීම රු. 11,000 යි. |

මෙම ගනුදෙනු සටහන් කිරීමට පහත ආකාරයේ ආකෘතියක් භාවිතා කරන්න.

| දිනය | ගොඩනැගිලි + | තොගය + | ණයගැතියෝ + | මුදල් = | ප්‍රාග්ධනය + | බැංකු ණය + | ණයහිමියෝ |
|---|---|---|---|---|---|---|---|
| 12/01 | | | | | | | |
| 12/01 | | | | | | | |
| 12/05 | | | | | | | |
| 12/10 | | | | | | | |
| 12/15 | | | | | | | |
| 12/25 | | | | | | | |
| 12/30 | | | | | | | |
| 12/31 | | | | | | | |

(ලකුණු 05)

**(මුළු ලකුණු 12)**

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

06. (i) පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(අ) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10,000 යි.
(ආ) රු. 300,000 ක බැංකු ණයක් මහජන බැංකුවෙන් ලබා ගැනීම.
(ඉ) රු. 100,000 වටිනා භාණ්ඩ තොගයක් ණය පදනම මත මිලට ගැනීම.
(ඊ) බැංකු ණය වාරිකය ගෙවා දැමීම රු. 25,000 යි. එහි ඇතුලත් පොලිය රු. 5 000 යි.

(ලකුණු 04)

(ii) පහත දී ඇති වගුවේ වම්පස ඇති මූලික සටහන් පොත ඉදිරියෙන් එයට අදාල වන මූලාශ්‍ර ලේඛණය බැගින් ලියා දක්වන්න.

| මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛණය |
|---|---|
| • මුදල් පොත | ............................................................ |
| • බැංකු ගිණුම | ............................................................ |
| • සුළු මුදල් පොත | ............................................................ |
| • ගැනුම් ජ'නලය | ............................................................ |
| • විකුණුම් ජ'නලය | ............................................................ |
| • පොදු ජ'නලය | ............................................................ |

(ලකුණු 03)

(iii) සමන්මලීගේ ව්‍යාපාරයේ 2023.09.01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ණයගැති ශේෂය | 60,000 |
| ණයහිමි ශේෂය | 40,000 |
| මුදල් ශේෂය | 50,000 |

2023 සැප්තැම්බර් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| සැප්. 10 | ණයගැතියන්ගේ ලද මුදල රු. 19,000 යි. අඩු කළ වට්ටම් රු. 1 000 කි. |
| සැප්. 15 | ණයහිමියන්ට ගෙවූ මුදල රු. 28,500 යි. ලද වට්ටම රු. 1500 කි. |
| සැප්. 20 | ණයගැතියන්ගෙන් රු. 10,000 ක ණය ලැබීමේ දී අඩු කළ වට්ටම 5% කි. |
| සැප්. 25 | ණයහිමියන්ට රු. 10,000 ක ණය ගෙවීමේ දී ලද වට්ටම 5% කි. |

ඉහත ගනුදෙනු, මුදල් පොත (මුදල් ගිණුම) ඇතුළු අදාල ලෙජර ගිණුම් වල සටහන් කර ඒවා තුලනය කර පෙන්වන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 12)**

[සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved]

07. (i) රවීගේ ව්‍යාපාරයේ 2023 සැප්තැම්බර් මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.

**2023.09.01 දිනට පැවති ශේෂයන්**

| | | රු. |
|---|---|---|
| මුදල් | | 150, 000 |
| ණයගැතියෝ - | අමල් | 10, 000 |
| | විමල් | 15, 000 |
| ණයහිමියෝ - | කමල් | 25, 000 |
| ප්‍රාග්ධනය | | 150, 000 |

2023 සැප්තැම්බර් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | ගනුදෙනුව |
|---|---|---|---|
| 2023.09.05 | 25 | - | බැංකු ණයක් ලබා ගැනීම රු. 300,000 |
| 2023.09.10 | - | 30 | ණයහිමි කමල්ට මුදල් ගෙව්වා රු. 15,000 |
| 2023.09.15 | 26 | - | ණයගැති විමල්ගෙන් මුදල් ලැබුණා රු. 20,000 |
| 2023.09.20 | - | 31 | සේවක වැටුප් ගෙව්වා. රු. 30,000 |
| 2023.09.25 | - | 32 | භාණ්ඩ මිලට ගැනුම් රු. 50,000 |
| | 27 | | අත්පිට විකුණුම් රු. 80,000 |
| 2023.09.26 | - | - | අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 2,000 |
| 2023.09.30 | 28 | - | විකුණුම් රු. 12,000. මේ සඳහා රු. 12,000 වටිනා චෙක්පතක් එදිනම ලැබුණි. |

ඉහත තොරතුරු භාවිතා කොට රවීගේ ව්‍යාපාරයේ,

(අ) මුදල් ගිණුම (මුදල් පොත) පිළියෙල කර එය තුලනය කරන්න.

(ආ) අදාල ලෙජර ගිණුම් පිළියෙළ කරන්න. (ලකුණු 08)

(ii) හෂාන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3,000 වන අතර 2023 සැප්තැම්බර් මාසයේ සිදු වූ සුළු මුදල් ගනුදෙනු පහත දැක්වේ. (2023 සැප්තැම්බර් 01 සහ 2023 ඔක්තොම්බර් 01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කර ඇත.)

| **දිනය** | **සු.මු.ගෙ. වවුචර් අංකය** | **විස්තරය** | **වටිනාකම (රු.)** |
|---|---|---|---|
| 2023.09.01 | - | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | 2 500 |
| 2023.09.04 | 01 | ගමන් වියදම් | 300 |
| 2023.09.08 | 02 | සංග්‍රහ වියදම් | 400 |
| 2023.09.12 | 03 | පෑන් පැන්සල් මිලට ගැනීම | 200 |
| 2023.09.16 | 04 | ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම | 300 |
| 2023.09.20 | 05 | තැපැල් වියදම් (මුද්දර මිලට ගැනීම) | 100 |
| 2023.09.24 | 06 | අමාලීට ගෙව්වා | 500 |
| 2023.09.28 | 07 | ගමන් වියදම් (ත්‍රීරෝද රථ වියදම්) | 300 |
| 2023.10.01 | - | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා | - |

ඉහත තොරතුරු විශ්ලේෂණ තීරු හතරකට සීමාවන පරිදි **(තැපැල්, ලිපි ද්‍රව්‍ය, සංග්‍රහ සහ ගමන් වියදම්)** සුළු මුදල් පොත පිළියෙළ කර, එය තුලනය කරන්න. (ලකුණු 04)

**(මුළු ලකුණු 12)**


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න